ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය වැඩ සටහන

අවසාන පරීක්ෂණය 2005/2006

ගිණුම්කරණය හා මූල්‍ය හැඳින්වීමක් **- MCC 1206**

කාලය - පැය දෙකයි (02)

---

දිනය : 2006.02.25 වේලාව : ප.ව.01.30 සිට ප.ව.03.30 දක්වා

---

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ 4 කට පමණක් පිළිතුරු සපයන්න.

වැඩ සටහන් ගත නොකල ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලැබේ.

01. පහත සඳහන් ශේෂ පිරික්සුම 2005 මාර්තු 31 න් අවසන් වසර සඳහා නුගේගොඩ පිහිටි "පියසේන ස්ටෝර්ස්" හි පොත්වලින් උපුටා ගන්නා ලදී.

### ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| තොගය 01/04/2004 | 675,000 | |
| ගෙන ඒමේ කුළී | 18,900 | |
| ගෙන යාමේ කුළී | 6,400 | |
| විදුලිය | 26,000 | |
| ලිපි ද්‍රව්‍ය | 18,000 | |
| රක්ෂණය | 16,000 | |
| ණය පොළී | 60,000 | |
| බොල් ණය | 11,000 | |
| ආපසු එවුම් | 21,000 | |
| ගැණුම් | 1,160,000 | |
| ගොඩනැගිලි | 700,000 | |
| ලීබඩු සහ සවි කිරීම් | 300,000 | |
| රථවාහන | 600,000 | |
| පරිගණක සහ ආශ්‍රිත උපාංග | 125,000 | |
| වරිපනම් | 1,800 | |
| විගණන ගාස්තු | 15,000 | |
| නීති ගාස්තු | 8,000 | |
| තැපැල් වියදම් | 1,500 | |
| දුන් වට්ටම් | 7,400 | |
| ණය ගැතියෝ | 150,000 | |
| ලැබිය යුතු විනිමය බිල් | 600,000 | |
| බැංකු ශේෂය | 365,000 | |
| මුදල් ශේෂය | 80,000 | |
| ප්‍රාග්ධනය | | 1,200,000 |
| විකුණුම් | | 2,000,000 |
| බැංකුණය (වාර්ෂික පොළිය 16%) | | 800,000 |
| ණය හිමියෝ | | 600,000 |

| | | |
|---|---|---|
| වෙනත් ආදායම් | | 65,500 |
| ලද වට්ටම් | | 24,000 |
| **ක්ෂය සඳහා වෙන් කිරීම්** | | |
| ගොඩනැගිලි | | 70,000 |
| ලීබඩු සහ සවිකිරීම් | | 30,000 |
| රථවාහන | | 60,000 |
| පරිගණක සහ ආශ්‍රිත ද්‍රව්‍ය | | 12,500 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 4,000 |
| | 4,966,000 | 4,966,000 |

පහත සඳහන් අමතර තොරතුරු ඔබට සපයා ඇත.

**(i)** 2005 මාර්තු 31 දිනට තොගය රු 350,000/- කි

**(ii)** කලින් ගෙවූ වියදම් රක්ෂණය රු 1,500/-
වරිපනම් රු 400/-

**(iii)** 2005 මාර්තු 31 දිනට උපචිත වියදම්
විගණන වියදම් රු 5,000/-
විදුලිය රු 1,700/-

**(iv)** සියළුම ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය මත 10% කින් ක්ෂය කරන්න.

**(v)** ව්‍යාපාර හිමිකරු විසින් පුද්ගලික අවශ්‍යතාවයට ගත් රු 5,000/-ක මුදලක් පොත්වල සඳහන් වී නොමැත.

පහත සඳහන් මූල්‍ය වාර්තා පිළියෙල කරන්න.

(i) 2005 මාර්තු 31 න් අවසන් වසර සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

(ii) 2005 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය

(ලකුණු 40)

02. (අ) ගිණුම්කරණය යන්න නිර්වචනය කර ගිණුම්කරණයේ අන්තර්ගත වන විවිධ කාර්යයන් සඳහන් කරන්න.

(ආ) ස්ථාවර ප්‍රාග්ධනය සපයාගත හැකි විවිධ මූලාශ්‍ර 4 ක් සඳහන් කරන්න.

(ඇ) දුර්වල මුදල් කළමනාකරණය නිසා කුඩා ව්‍යාපාරිකයින්ට මුහුණ දීමට සිදුවන ගැටළු මොනවා ද?

(ඈ) බැංකු අණකරය සහ බැංකු ණය අතර වෙනස කුමක් ද ?

(ඉ) අවිධිමත් පොත් තැබීම නිසා කුඩා ව්‍යාපාර හිමියන්ට මුහුණදීමට සිදුවන ගැටළු මොනවා ද ?

(ලකුණු 20)

03. 2006 ජනවාරි 01 වන දිනට මුදල් ශේෂය රු 30,000/-

| විස්තරය | ජනවාරි | පෙබරවාරි | මාර්තු |
|---|---|---|---|
| <u>මුදල් ලැබීම් සහ ගෙවීම්</u> | | | |
| විකුණුම් | 570,000 | 650,000 | 720,000 |
| වෙනත් ආදායම් | 60,000 | 90,000 | 70,000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 150,000 | 140,000 | 170,000 |
| ලද විකුණුම් කොමිස් | 20,000 | 50,000 | 40,000 |
| විකුණුම් කොමිස් ගෙවීම් | 60,000 | 68,000 | 80,000 |
| නව හවුල්කරුවාගේ ප්‍රාග්ධනය | - | - | 300,000 |
| වැටුප් හා වේතන | 35,000 | 35,000 | 35,000 |
| විවිධ වියදම් | 18,000 | 17,000 | 21,000 |
| ආයතන වියදම් | 15,000 | 18,000 | 20,000 |
| සේවකයන් පුහුණු කිරීමට | 12,000 | - | - |
| ණයගැතියන්ගෙන් ලැබීම් | - | 350,000 | - |
| ණය හිමියන්ට ගෙවීම් | - | - | 250,000 |
| නව යන්ත්‍ර සහ ප්‍රාග්ධන වියදම් | - | - | 600,000 |
| බෙදා හැරීමේ වෑන් රථයක් මිළදී ගැනීම | - | - | 680,000 |
| වෑන් රථය සඳහා ඉන්ධන වියදම් | - | - | 25,000 |
| අලෙවි හා බෙදා හැරීමේ වියදම් | - | - | 18,000 |
| ලද ලාභාංශ | 80,000 | - | - |
| නිමල්ගෙන් ණය මුදලක් | - | 300,000 | - |
| ගැනුම් | - | 80,000 | 150,000 |
| ගෙන ඒමේ කුළී | - | - | 8,000 |
| විකුණුම් (ප්‍රවර්ධන මත) | - | - | 275,000 |

ඉහත දත්ත උපයෝගී කරගෙන 2006 මාර්තු 31 න් අවසන් වන කාර්තුව සඳහා මුදල් අයවැය ලේඛණක් පිළියෙල කරන්න.

(ලකුණු 20)

04. (අ) බැංකු අයිරාවක් යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේ ද?

(ආ) කර්මාන්ත ශාලාවක තිබිය හැකි තොග වර්ග 3 ක් නම් කරන්න.

(ඇ) "ගුණසේන ස්ටෝර්ස් " හි පොත්වලින් පහත සඳහන් දත්ත උපුටා ගන්නා ලදී.

ප්‍රාග්ධනය රු 1,000,000/-
ස්ථාවර වත්කම් රු 500,000/-
ජංගම වත්කම් (අවසන් තොගය හැර) රු 400,000/-
මුළු විකුණුම් රු 1,500,000/-
ජංගම වගකීම් රු 240,000/-
අවසන් තොගය රු 100,000/-
මුළු මෙහෙයුම් වියදම් රු 200,000/-
දිගුකාලීන ආයෝජන රු 500,000/-
කීර්ති නාමය රු 300,000/-
විකුණුම් පිරිවැය රු 800,000/-

ඉහත දත්ත ඇසුරෙන් පහත සඳහන් මූල්‍ය අනුපාත ගණනය කරන්න.

i. ශුද්ධ ලාභ අනුපාතය
ii. දළ ලාභ අනුපාතය
iii. ජංගම අනුපාතය
iv. ක්ෂණික අනුපාතය
v. ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතය

(ලකුණු 20)

05. අ. උදාහරණ භාවිතා කරමින් ද්විත්ව සටහන් ක්‍රමය පැහැදිලි කරන්න.

ආ. ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ විකල්ප ක්‍රම මොනවා ද? උදාහරණ භාවිතා කරමින් පැහැදිලි කරන්න.

ඇ. මධ්‍යම හා සුළු පරිමාණ කර්මාන්ත ආයතන විසින් අනුගමනය කරනු ලබන ප්‍රධාන පිරිවැයකරණ ක්‍රම මොනවාද ?

ඈ. ගිණුම්කරණ සංකල්ප 4 ක් නම් කරන්න.

ඉ. "බැංකු සැසඳුම් ලේඛණය" යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේ ද? එම ලේඛණය පිළියෙල කිරීමේ වාසි මොනවා ද ?

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -